ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2019/04/23 |

## උද්ධමනය 2019 මාර්තු මාසයේ දී ඉහළ යන ලදී

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, ප්‍රධාන වශයෙන්ම පසුගිය වසරේ අනුරූප මාසයේ දී පැවති අඩු පදනම් අගය හේතුවෙන් 2019 පෙබරවාරි මාසයේ පැවති සියයට 2.4 හි සිට 2019 මාර්තු මාසයේ දී සියයට 2.9 දක්වා ඉහළ ගියේය. මේ අතර, ආහාර සහ ආහාර නොවන කාණ්ඩයන්හි ලක්ෂ්‍යමය උද්ධමනය 2019 මාර්තු මාසයේ දී පිළිවෙලින් සියයට -2.3 සහ සියයට 7.1 ලෙස වාර්තා විය.

**මතුපිට උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 2.9%

වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 1.7%

මාසික වෙනස : -0.2%

**මූලික උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 5.8%

වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 3.3%

මාසික වෙනස : 0.4%

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස, 2019 මාර්තු මාසයේ දී සියයට 1.7 හි නොවෙනස්ව පැවතුණි.




මාසික වෙනස් වීම සලකා බැලීමේදී, සහල්, පොල් සහ එළවළු මිලගණන් පහළ යෑම ප්‍රධාන කොටගෙන ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිලගණන්වල සිදු වූ පහළ යෑම, 2019 මාර්තු මාසයේදී ජා.පා.මි.ද. සියයට 0.2 කින් පහළ

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

යෑමට හේතු විය. කෙසේ වුවද, ආහාර නොවන කාණ්ඩයෙහි මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ; ප්‍රවාහන (පෙට්‍රල් සහ ඩීසල්); රෙදිපිළි හා පාවහන්; සහ විවිධ භාණ්ඩ හා සේවා උපකාණ්ඩයන්හි අයිතමවල මිලගණන් මාසය තුළ දී ඉහළ ගියේය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි දර්ශකයෙහි මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2019 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ සියයට 5.5 හි සිට 2019 මාර්තු මාසයේ දී සියයට 5.8 දක්වා ඉහළ ගියේය. මේ සඳහා, ප්‍රධාන වශයෙන් මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ උපකාණ්ඩයෙහි අයිතමවල මිලගණන් ඉහළ යෑම නිසා ආහාර නොවන කාණ්ඩයෙහි පෙන්නුම් කළ මිලගණන් ඉහළ යෑම හේතු විය. මේ අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද 2019 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ සියයට 3.0 හි සිට 2019 මාර්තු මාසයේ දී සියයට 3.3 දක්වා ඉහළ ගියේය.

## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2017 | මාර්තු | 119.5 | 122.3 | -0.3 | 0.2 | 8.6 | 7.0 | 5.6 | 6.6 |
| | අප්‍රේල් | 121.0 | 122.5 | 1.3 | 0.2 | 8.4 | 5.9 | 6.0 | 6.6 |
| | මැයි | 121.8 | 123.0 | 0.7 | 0.4 | 7.1 | 4.7 | 6.1 | 6.4 |
| | ජූනි | 123.4 | 123.1 | 1.3 | 0.1 | 6.3 | 4.1 | 6.1 | 6.1 |
| | ජූලි | 122.4 | 122.9 | -0.8 | -0.2 | 6.3 | 4.2 | 6.2 | 5.9 |
| | අගෝස්තු | 122.3 | 123.0 | -0.1 | 0.1 | 7.9 | 4.8 | 6.5 | 5.8 |
| | සැප්තැම්බර් | 123.3 | 123.1 | 0.8 | 0.1 | 8.6 | 4.6 | 6.8 | 5.7 |
| | ඔක්තෝබර් | 124.8 | 123.1 | 1.2 | 0.0 | 8.8 | 4.1 | 7.1 | 5.6 |
| | නොවැම්බර් | 126.4 | 123.8 | 1.3 | 0.6 | 8.4 | 2.8 | 7.5 | 5.2 |
| | දෙසැම්බර් | 126.6 | 123.8 | 0.2 | 0.0 | 7.3 | 2.7 | 7.7 | 4.9 |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |
| | අප්‍රේල් | 122.9 | 124.8 | 0.1 | 0.2 | 1.6 | 1.9 | 6.1 | 3.3 |
| | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 | 5.7 | 3.1 |
| | ජූනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 | 5.3 | 2.9 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 | 5.1 | 2.7 |
| | අගෝස්තු | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 | 4.7 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 | 4.0 | 2.4 |
| | ඔක්තෝබර් | 124.9 | 127.3 | 0.4 | 0.3 | 0.1 | 3.4 | 3.3 | 2.4 |
| | නොවැම්බර් | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 | 2.7 | 2.4 |
| | දෙසැම්බර් | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 | 2.1 | 2.4 |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව